# 2022 අගෝස්තු මස මාසික සභා රැස්වීම

## වැලිගෙපොල ප්‍රාදේශීය සභාව

2022 අගෝස්තු මස මාසික සභා රැස්වීම 2022.08.18 වන දින පෙ.ව.10.00 ට ගරු සභාපති කැළුම් ප්‍රියංකර ජයසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී පවත්වනු ලැබීය.

එදින සභා රැස්වීමට පහත නම් සඳහන් අය සහභාගී වූහ.

1. ගරු උප සභාපති - ඩබ්ලිව්.ඒ.සමන්ජීවලාල් වීරසිංහ මැතිතුමා
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජී.ජී.සිසිර ප්‍රේමකුමාර මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.ඒ.රෝහණ විජේරත්න මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.බුද්ධික විරසිංහ මැතිතුමා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.එච්.සිරිපාල මැතිතුමා
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.එම්.අයි.පී.රණතුංග මැතිතුමා
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජී.එල්.ලාල් කුමාරරත්න මැතිතුමා
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.ජී.ශාන්ත දෙල්ගහකොට්ටුව මැතිතුමා
9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.කේ.ප්‍රසාද් අසිත මැතිතුමා
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - ඒ.ඩබ්ලිව්.සුමනාවතී මැතිතුමිය
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - පී.ආර්.එස්.ධම්මිකා මැතිතුමිය
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - වයි.කේ.අයි.තමරා කුමාරි යටිකිඳ මැතිතුමිය
13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එන්.ජී.යූ.ඩබ්ලිව්.කුමාර මැතිතුමා

**නිලධාරී සහභාගීත්වය**

1. ප්‍රාදේශීය සභාවේ ලේකම් - එස්.එච්.ඒ.කරුණාරත්න මිය
2. කළමනාකරණ සේවා නිලධාරී - එච්.ඒ.පී.එන්.හෙට්ටිආරච්චි මිය
3. කළමනාකරණ සේවා නිලධාරී - පී.කේ.ඩී.සී.කුමාරි මිය

මෙදින සභා රැස්වීමට සහභාගී වූ ගරු සභාපතිතුමා විසින් මන්ත්‍රී මණ්ඩලයත්, ලේකම්තුමිය ඇතුළු කාර්යමණ්ඩලයත්, මාධ්‍යවේදී මහතාත් පිළිගැනීමෙන් අනතුරුව සභාවේ කටයුතු ආරම්භ කරන ලදී.

### 1. පසුගිය සභා රැස්වීමේ වාර්තාව සභා සම්මත කිරීම

2022.07.21 වන දින මාසික සභා රැස්වීම් වාර්තාව සත්‍ය වාර්තාවක් බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.අයි.පී.රණතුංග මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එච්.සිරිපාල මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසු ඒකමතිකව සභා සම්මත විය.

### 2. ගරු සභාපතිතුමාගේ නිවේදන

### 2.1. ජල බිල්පතේ නම සංශෝධනය කිරීම

- නිමල් රූබසිංහ යාපා නමින් ඇති අංක UD1/5 දරණ ජල බිල්පත වයි.එම්.ඩී.සී.බණ්ඩාර නමින් සංශෝධනය වන බව සභාවේ දැනගැනීම සඳහා ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලදී.

## 2.2. වැලිගෙපොල ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය පිළිබඳ විගණකාධිපති වාර්තාව

2021 වර්ෂය සඳහා පිළියෙල කරන ලද යථෝක්ත වාර්තාව අනුව විගණකාධිපති විසින් මෙම සභාවේ මූල්‍ය ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති වාර්තාවේ 1.1 හි තත්වාගණනය කල මතය ගරු සභාපතිතුමා විසින් සභාවේ දැන ගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.

## 3. සභාව නමින් ලැබී ඇති ලිපි,පෙත්සම් හා පැමිණිලි ඉදිරිපත් කිරීම

## 3.1. නිවාඩු අනුමත කර ගැනීම.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී අචිනි එස්.අබේවික්‍රම මැතිතුමිය, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.ඉන්ද්‍රජිත් සමන්ජීව, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ඒ.දමිත් විජේරත්න මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී එන්.වී.ශ්‍රීමාවතී මැතිතුමිය, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.ඒ.ගුණතිලක මැතිතුමා සහ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ආර්.රත්නපාල මැතිතුමා අසනීප වීම හේතුවෙන් අද දින සභා රැස්වීමට සහභාගී නොවන බව දන්වා එවා ඇති බැවින්, නිවාඩු අනුමත කිරීම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.කේ.ප්‍රසාද් අසිත මැතිතුමා විසින් යෝජනා කිරීමෙන් හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එච්.සිරිපාල මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසුව එම නිවාඩු අනුමත විය.

## 4. යථා පරිදි කල්දී ඇති ප්‍රශ්න

යථා පරිදි කල්දී ඇති ප්‍රශ්න කිසිවක් නොවීය.

## 5. කල් දී ඇති යෝජනා

## 5.1. ගරු සභාපති කැළුම් ප්‍රියංකර ජයසිංහ මැතිතුමා

ගරු සභාපතිතුමා විසින් පහත සඳහන් යෝජනා සභාවට ඉදිරිපත් කරන ලදී.

I. ගලි බවුසර් සේවාව සඳහා ආර්.ඩී.එස්.එල්.රාජපක්ෂ යන අය විසින් ගෙවූ රුපියල් 6150.00 ක මුදල එම සේවාව ලබාදීමට නොහැකිවීම හේතුවෙන් ප්‍රවාහන ගාස්තු අය කර ඉතිරි රුපියල් 5750.00 ක මුදල ආපසු ගෙවීමට අනුමැතිය ලබාගැනීම අවශ්‍ය බවට යෝජනා කරන ලදි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.සිසිර ප්‍රේම කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

මෙහිදී අදහස් දැක්වූ ගරු සභාපතිතුමා, ඉහත නම් සඳහන් අය විසින් ගලි බවුසර් සේවාව ලබා ගැනීම සඳහා මුදල් තැන්පත් කලද, එම ස්ථානයේ පැවති දෝෂ හේතුවෙන් එම සේවාව සැපයීමට නොහැකි වූ බැවින් ඔහුගෙන් ලබා ගත් මුදල්, සේවාව සැපයිම සඳහා වූ ප්‍රවාහන වියදම වන රු.400.00 තබා ගනිමින් රු.5750.00 ක ඉතිරි මුදල ආපසු ලබා දීමට සිදුවී ඇති බව පැහැදිලි කළේය. ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

II. ගල්පාය කඩ කාමර 5 සඳහා 2023 වර්ෂයට අදාලව ගාස්තු පැනවීම සඳහා අවශ්‍ය තක්සේරු වාර්තාවක් ලබාගැනීම හා ඉදිරි කටයුතු සිදුකර ගැනීමට අනුමැතිය ලබාගැනීම අවශ්‍ය බවත්,

III. පෙළගෙවත්තේ ඉඩම් 07, පැරණි දුම්රිය පාරේ ඇති ගොඩනැගිල්ල හා ඕපනායක පොළ ඉදිරිපිට අංක 08 කඩ කාමරයට යාබද කොටස සඳහා 2023 වර්ෂයට අදාලව මාසික බදු මුදල තීරණය කිරීම සඳහා මිනින්දෝරු සැලැස්ම සකස් කර තක්සේරු වාර්තාවක් ලබාගැනීම අවශ්‍ය බවත් යෝජනා කරන ලදි.

ඉහත ii හා iii යෝජනා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ඒ.ඩබ්ලිව්.සුමනාවතී මැතිතුමිය විසින් ස්ථිර කරන ලදි.

ඉහත යෝජනා සම්බන්ධයෙන් අදහස් දැක්වූ සභාපතිතුමා, මේ සඳහා අවශ්‍ය පරිදි මිනින්දෝරු සැලැස්මක් සකස් කර තක්සේරු වාර්තාවක් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු කළ යුතු බවත් 2023 වර්ෂය සඳහා ගාස්තු පැනවීමේදී නව තක්සේරුවක් අවශ්‍ය බවත් පැහැදිලි කිරීමෙන් අනතුරුව එම යෝජනා ඒකමතිකව සභා සම්මත විය.

IV. හෙළ බොජුන් හල ගිවිසුම් කෙටුම්පත අනුමත කර ගැනීම අවශ්‍ය බව යෝජනා කළේය. (ඇමිණුම 1 යා කෙරේ.)

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ. එම්.අයි.පී.රණතුංග මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

මෙහිදී ගිවිසුම් කෙටුම්පත සභාවට ඉදිරිපත් කරමින් අදහස් දැක්වූ ගරු සභාපතිතුමා, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පූර්ණ අධීක්ෂණය යටතේ තෝරාගත් බදුකරුවන්ට, ආහාර වර්ග බෙදා වෙන්කර දී මෙම හෙළ බොජුන් හල පවත්වාගෙන යෑමට කටයුතු සූදානම් කර ඇති බවත්, තවද රාජ්‍ය නිලධාරීන්, ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් හා ප්‍රදේශවාසීන් සම්බන්ධ කරගෙන 2022 සැප්තැම්බර් මස පළමු වන දින, සරල අයුරින් මෙය විවෘත කිරීමට අපේක්ෂා කරන බවත් ප්‍රකාශ කළ අතර, ඒ සඳහා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් මන්ත්‍රීවරියන් හට සහභාගි වන ලෙස ආරාධනා කළේය. ඒ අනුව එකී බදුකරුවන්ට ඕපනායක හෙළ බොජුන්හළ පරිශ්‍ර බදු දීමට සභාව හා නෛතිකව බැඳීමට සකස් කරන ලද ගිවිසුමේ කෙටුම්පත අනුමත කර ගැනීම අවශ්‍ය බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි. අනතුරුව එකී ගිවිසුම් කෙටුම්පත ඒකමතිකව සභා සම්මත විය.

V. ජල සම්බන්ධතා සඳහා වන ස්ථාවර ගාස්තුව සංශෝධනය කිරීම සුදුසු බව යෝජනා කළේය.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.ශාන්ත කුසුම් කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

එහිදී අදහස් දැක්වූ ගරු සභාපතිතුමා, වර්ථමානයේ පවතින මිළ ගණන් අනුව, නව ජල සම්බන්ධතාවක් ලබා දීමේදී දැරීමට සිදුවන මූලික වියදම් වැඩි වී ඇති බැවින්, ජල සම්බන්ධතා ලබා දීම සඳහා දැනට පවතින රු.10,500.00 ක ගාස්තුව ප්‍රමාණවත් නොවන අතර නව වියදම් ඇස්තමේන්තුව රු.16,142.00 ක් වන බැවින්, නව ජල සම්බන්ධතා ගාස්තුව රු.16,250.00 ලෙසට සංශෝධනය වියයුතු බව තීරණය වූ අතර එම ගාස්තු සංශෝධනය කිරීමේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

VI. පී.ඩබ්.රංජිත් රණවීර, ඒ.බී.ඒ.එන්.ප්‍රේමරත්න, එස්.එම්.ශෂිකා සඳමාලි හා එම්.රාජේන්ද්‍රන් යන කම්කරුවන්ගේ සේවය ඉදිරි මාස 03 ක කාලය සඳහාද මිලදී ගැනීමට අවශ්‍යව ඇති බැවින් ඒ සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලෙස ඉල්ලා සිටින ලදි. එකී කාලයට අදාළ සේවක අර්ථසාධක අරමුදල හා සේවා නියුක්ති භාරකාර අරමුදලේ සාමාජිකත්වය ලබාදීමට අනුමැතිය ලබාගැනීම අවශ්‍ය බව යෝජනා කළේය.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එච්.සිරිපාල මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

එහිදී අදහස් දැක්වූ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.බුද්ධික විරසිංහ මැතිතුමා, සභාවේ කම්කරුවන් පිරිසක් යොදවා රංවල, දෙල්වලකන්ද-බටදූර මාර්ගය දෙපස එළි පෙහෙළි කිරීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටියේය.

ඒ අනුව ඉහත නම් සඳහන් කම්කරුවන්ගේ සේවය ඉදිරි මාස 03ක කාලය සඳහාද මිලදී ගැනීම හා එකී කාලයට අදාළ සේවක අර්ථසාධක අරමුදල හා සේවා නියුක්ති භාරකාර අරමුදලේ සාමාජිකත්වය ලබාදීමට වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

VII. ලියාපදිංචි ග්‍රාමීය සමිති සඳහා සභාව සතු කූඩාරම් 5 සහ GI බට ලබාදීම සඳහා අනුමැතිය ලබාගැනීම අවශ්‍ය බව යෝජනා කරන ලදි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී වයි.කේ.අයි.තමරා කුමාරි යටිකිඳ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදි.

මෙහිදී අදහස් දැක්වූ ගරු සභාපතිතුමා, සභාව සතු කූඩාරම් සහ GI බට ගබඩා කිරීම සඳහා, ගබඩා පහසුකම් ප්‍රමාණවත් නොවීම හේතුවෙන් මේ වන විට දිරායාමට ලක්වී ඇති බැවින් සභාවේ අවශ්‍යතාවය සඳහා බට 50ක් පමණ රඳවාගෙන ඉතිරි ප්‍රමාණය හා කූඩාරම් 05ක් ලියාපදිංචි ග්‍රාමීය සමිති වෙත නිදහස් කිරීම සුදුසු බව ප්‍රකාශ කළේය. ඒ අනුව ලියාපදිංචි ග්‍රාමීය සමිතිවල ඉල්ලීම් ලිපි සලකා බලා, මෙම කූඩාරම් සහ GI බට ලබාදීමට තීරණය වූ අතර එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

VIII. ලේඛනාගාරයේ ලිපිගොනු අපහරණය සඳහා අපහරණ මණ්ඩලයක් පත්කර ගැනීම අවශ්‍ය බව යෝජනා කළේය.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එල්.ලාල් කුමාරරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.
ඒ අනුව,
<u>අපහරණ මණ්ඩලය ලෙස</u>

- ගරු සභාපති - කේ.ඕ.කැළුම් ප්‍රියංකර ජයසිංහ මැතිතුමා
- ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.එච්.සිරිපාල මැතිතුමා
- ප්‍රාදේශීය සභාවේ ලේකම් - එස්.එච්.ඒ.කරුණාරත්න මිය
- සංවර්ධන නිලධාරී - කේ.පී.ජී.පී.කුමාරසිංහ මිය
- සංවර්ධන නිලධාරී - එස්.එච්.එල්.එල්.ජයසූරිය මිය
- සංවර්ධන නිලධාරී - ඒ.එම්.නිලානි සන්ධ්‍යා මිය
- ප්‍රජා සංවර්ධන නිලධාරී - ටී.කේ.පී.ආර්.යූ.පී.කුමාරි මිය ද, පත්කරගැනීමෙන් පසු

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

IX. ඕපනායක කඩ කාමර 08 සඳහා 2022 වසරේ සිට වසර 03ක් ක්‍රියාත්මක වන පරිදි ලබා දී ඇති තක්සේරුව, ටෙන්ඩර් කොන්දේසි වලට අනුව වසර 05කට වරක් සිදු කිරීම හා එම කඩ කාමර සඳහා අවම පහසුකම් ඇති බැවින් නැවත සංවර්ධනය කරන තෙක් වර්තමාන තක්සේරු මුදල අඩු කර ගැනීමට අවශ්‍ය බව යෝජනා කළේය.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඒ.රෝහණ විජේරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

මෙහිදී අදහස් දැක්වූ ගරු සභාපතිතුමා, ඉහත ඉල්ලීම් බදුකරුවන් විසින් දිගින් දිගටම ඉල්ලා සිටින බැවින් ඒ සම්බන්ධව ගරු සභාවේ අදහස් විමසන ලදි. එයට අදහස් එක් කළ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ජී.යූ.ඩබ්ලිව්.කුමාර මැතිතුමා විසින් රජයෙන් ලබා දී ඇති තක්සේරුවේ සඳහන් පරිදි අවුරුදු තුනෙන් තුනට සිදු කිරීම සුදුසු බව ප්‍රකාශ කරන ලදි. එම නීතිරීති හා ගිවිසුමේ කොන්දේසින්වලට අදාළව කටයුතු කිරීමට නොහැකි බදුකරුවන් සිටීනම් ගිවිසුම අවලංගු කර නැවත කඩ කාමර සභාව වෙත පවරා ගැනීම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එල්.ලාල් කුමාරරත්න මැතිතුමා සඳහන් කළේය.අවසානයේදී ගරු සභාව විසින් රජයේ නියමයන්ට අනුකූලව තක්සේරුව සිදු කිරීමටත්, හිඟ මුදල් සමඟ බදු කුලිය අයකරගැනීමටත් තීරණය වූ අතර අදාළ බදු මුදල් නොගෙවන්නේනම් ඉදිරි නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සුදුසු බව තීරණය කරන ලදි. ඒ අනුව ඉහත ඕපනායක කඩ කාමර 08 සඳහා 2022 වසරේ සිට වසර 03ක් ක්‍රියාත්මක වන පරිදි ලබා දී ඇති තක්සේරුව,ටෙන්ඩර්

කොන්දේසි වලට අනුව වසර 05කට වරක් සිදු කිරීම සඳහා සියලු ගරු මන්ත්‍රීතුමන්ලා විරුද්ධත්වය දැක්වූ බැවින් එම යෝජනාව සභා සම්මත නොවිණි.

6. **කාරක සභා වාර්තා සලකා බැලීම.**

## 6.1. මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කමිටු වාර්තා

2022.07.22 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභා වාර්තාව මහා සභාවේ සලකා බැලීම පිණිස ඉදිරිපත් කරන ලදී.

7. **ආදායම් වියදම් වාර්තා**

## 7.1. 2022 ජූනි මස ආදායම් වියදම් වාර්තාව

| ලැබීම් සාරාංශය | (රුපියල්) | වැය සාරාංශය | (රුපියල්) |
|---|---|---|---|
| වරිපනම් බදු | 584,849.13 | වැටුප් හා දීමනා | 4,304,886.00 |
| කුලී | 416,257.98 | ගමන් වියදම් | 6,700.00 |
| බලපත්‍ර ගාස්තු | 73,400.00 | සැපයුම් හා උපකරණ | 565,845.67 |
| සේවා සඳහා ගාස්තු | 45,410.00 | ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියා හා නඩත්තුව | 51,250.00 |
| වරෙන්තු ගාස්තු හා දඩ | 1,121.03 | ප්‍රවාහන සම්බන්ධතා හා ආවශ්‍යක සේවා | 284,695.51 |
| වෙනත් ආදායම් | 10,802.27 | පොලී ගෙවීම් ලාභාංශ හා ප්‍රසාද මුදල් | - |
| වෙනත් ආධාර | 3,866,257.62 | ආධාර මුදල් දායක මුදල් සහනාධාර | - |
| පුනරාවර්ථන ආදායම් එකතුව | 4,998,098.03 | විශ්‍රාම වැටුප්,විශ්‍රාම ප්‍රතිලාභ,හා පාරිතෝෂික | 22,618.72 |
| මූලධන ලැබීම් | - | පුනරාවර්තන වියදම් එකතුව | 5,235,995.90 |
| ප්‍රාග්ධන ආදායම් එකතුව | - | ප්‍රාග්ධන වැය | 366,106.25 |
| පුනරාවර්ථන/ ප්‍රාග්ධනආදායම් එකතුව | 4,998,098.03 | ණය ආපසු ගෙවීම් | - |
| සේවක ණය | 137,714.67 | සේවක ණය | - |
| තැන්පත් | 19,760.00 | තැන්පත් | 5000.00 |
| අත්තිකාරම් | 101,000.00 | ණයහිමි | - |
| ණය ගැති(කර්මාන්ත) | - | අත්තිකාරම් | 185,000.00 |
| සමුච්චිත අරමුදල | - | ජල ගබඩා | - |
| | | ගබඩා(ඖෂධ) | - |
| වෙනත් ලැබීම් එකතුව | 258,474.67 | සමුච්චිත අරමුදල | 5,750.00 |
| | | වෙනත් ගෙවීම් | - |
| | | වෙනත් ගෙවීම් එකතුව | 195,750.00 |
| මුළු එකතුව | 5,256,572.70 | මුළු ගෙවීම් | 5,797,852.15 |

## 7.2. 2022 ජූනි 30 දිනට ආදායම් අය කිරීමේ ප්‍රගති වාර්තා

ඇමුණුම 1 යා කර ඇත.

## 8. පසුගිය සභා රැස්වීමේ ප්‍රගතිය සමාලෝචනය කිරීම

- පසුගිය සභා රැස්වීමට ඉදිරිපත් වූ යෝජනා විෂය නිලධාරීන් වෙත යොමුකර ඇති බව, ප්‍රකාශ කරන ලදී.

## 9. වෙනත් කරුණු

### 9.1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී වයි.කේ.අයි.තමරා යටිකිඳ මැතිතුමිය

මෙහිදී අදහස් දැක්වූ ගරු මන්ත්‍රීතුමිය, මහජන නියෝජිතයින් ලෙස බල ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් විශාල වගකීමක් හා වගවීමක් ඇති අතර, තම බල ප්‍රදේශය වන අකරැල්ල කොට්ඨාසයේ මහජනතාව වෙනුවෙන් එම ප්‍රදේශයට මෙම ධූර කාලය තුල සුළු හෝ සංවර්ධන කටයුත්තක් සිදු කිරීමට අවශ්‍ය බව සඳහන් කළාය.

තවද ප්‍රාදේශීය සභාව මගින් ක්‍රියාත්මක වන නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාව ප්‍රදේශයේ ජනතාවට මිල කළ නොහැකි සේවාවක් වන අතර ජනතාව වෙනුවෙන් හැකි සෑම විටකම එය විවෘත කර තබන ලෙස ගරු මන්ත්‍රීතුමිය විසින් ප්‍රකාශ කරන ලදි.

### 9.2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එල්.ලාල් කුමාරරත්න මැතිතුමා

හඳගිරිය ප්‍රදේශයේ වන අලියෙකු පහරදීමකින් තුවාල ලබා ඇති කාන්තාව වෙනුවෙන් ලබාදීමට එකඟ වූ රු.50,000.00 ක මුදල මේ වන තෙක් ලැබී නොමැති බැවින් ඒ සම්බන්ධව ගරු මන්ත්‍රීතුමා විසින් එය ප්‍රමාදවීම පිළිබඳව විමසුවේය.

### 9.3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී පී.ආර්.එස්.ධම්මිකා මැතිතුමිය

මෙහිදී අදහස් දැක්වූ ගරු මන්ත්‍රීතුමිය, වැලිගෙපොල කොට්ඨාසයේ ඌරාවල වසමේ සහනාධාර බෙදාදීමේ වැඩසටහනේදී සහනාධාර ලබාගත් පිරිසගේ නාමලේඛණය කඩිනමින් ගෙන්වා ගැනීමට කටයුතු කරන මෙන් ඉල්ලා සිටි අතර වැලිගෙපොල නගරය පිරිසිදු කිරීමේ කටයුතු නිසි පරිදි සිදුකරන ලෙසද ඉල්ලා සිටියාය.

### 9.4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එච්.සිරිපාල මැතිතුමා

සබරගමුව අරුණැල්ල වැඩසටහන යටතේ සිදුකළ ව්‍යාපෘති සඳහා මේ වන තෙක් මුදල් ප්‍රතිපාදන ලැබී නොමැති බැවින් කොන්ත්‍රාත්කරුවන් දැඩි අපහසුතාවයට පත් වී ඇති බව සඳහන් කළ ගරු මන්ත්‍රීතුමා, හැකියාවක් පවතීනම් සභා අරමුදලින් අදාළ ගෙවීම් සිදු කර ප්‍රතිපූරණය කර ගැනීම හෝ අදාළ ප්‍රතිපාදන අමාත්‍යාංශයෙන් ලබා ගැනීම කඩිනමින් සිදු කර දෙන ලෙස ඉල්ලා සිටියේය.

### 9.5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ඒ.ඩබ්ලිව්.සුමනාවතී මැතිතුමිය

ඕපනායක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මුදල් සහනාධාර ලබාදීමේදී අයථා සිදුවීම් සිදුවී ඇති බව ගරු මන්ත්‍රීතුමිය විසින් ප්‍රකාශ කරන ලද අතර තවද මෙහිදී සහනාධාර හිමියන්ට, රු.500.00 ක

මුදලක් තැන්පත් කර ගිණුමක් විවෘත කිරීමට සිදුවුවද අදාළ මුදල් ආධාර නිසි පරිදි නොලැබෙන බව ද ගරු මන්ත්‍රීතුමිය විසින් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදි.

## 9.6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.බුද්ධික වීරසිංහ මැතිතුමා

මෙහිදී අදහස් දැක්වූ ගරු මන්ත්‍රීතුමා, ජනතාවට සිදුවන අසාධාරණයන් සඳහා මහජන නියෝජිතයින් ලෙස ඍජුව මැදිහත් විය හැකි බවත් විවිධ රජයේ ආයතන හරහා සහනාධාර ලබාදිමේදී අකටයුතුකම් සිදුවී ඇත්ද යන්න පිළිබඳව තොරතුරු ලබා ගැනිමට ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් ලෙස හැකියාව පවතින බව ප්‍රකාශ කළේය.

## 9.7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඒ.රෝහණ විජේරත්න මැතිතුමා

මෙහිදී අදහස් දැක්වූ ගරු මන්ත්‍රීතුමා, සමෘද්ධි ආධාර ලැබෙන පිරිසටම සෑම සහනාධාරයක්ම ලබා දෙන අතර, අතරමැදි පිරිසට කිසිම සහනාධාරයක් නොලැබෙන බැවින් එම ක්‍රමවේදය එතරම් සුහදායක නොමැති බවත්, එම සහනාධාර බෙදාදීමේදී අඩු ආදායම්ලාභී සියලු පුද්ගලයන් පිළිබඳ සලකා බලා එම සහනාධාර බෙදාදීම සිදු කිරීම සුදුසු බව ප්‍රකාශ කළේය.

## සභා රැස්වීමේ නිමාව

සභා බල ප්‍රදේශයේ ජනතා ගැටළු විසඳීමට හැකි උපරිම පියවර ගැනීම සඳහා සෑමවිටම කටයුතු කරන බව පැවසූ ගරු සභාපතිතුමා , 2022.09.01 දින විවෘත කිරිමට නියමිත හෙළ බොජුන් හල විවෘත කිරීමේ අවස්ථාවට ගරු මන්ත්‍රීතුමන්ලාගේ හා මන්ත්‍රීතුමියන්ලාගේ පැමිණීම අපේක්ෂා කරන අතර අද දින රැස්වීමේ කටයුතු සාර්ථකව කරගෙන යාමට සහය ලබාදුන් සියළු දෙනාට සිය ස්තූතිය පුදකරමින් දහවල් 12.00 ට පමණ සභා රැස්වීමේ කටයුතු නිමාවට පත් කළේය.

කැළුම් ප්‍රියංකර ජයසිංහ,
සභාපති,
වැලිගෙපොල ප්‍රාදේශීය සභාව